*සැ. යු.*- 2013.09.20 දින පළ වූ අංක 1,829 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,830 - 2013 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා - 2013.09.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු … … … … | 1442 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … | 1445 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ඔක්තෝබර් මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ඔක්තෝබර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### ක්වාසි මණ්ඩලයේ සභාපති හා සාමාජිකයින් බඳවා ගැනීම සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සඳහන් සුදුසුකම් ඇති පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පිරිමියකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නකු හෝ නීතිඥයකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයකුට (අධිකරණ නිලධරයකු හැර) මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරුවන් වයස අවුරුදු 40ට වැඩි, මනා ශරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙක් විය යුතු ය.

මෙම මණ්ඩලයේ සභාපතිවරයාට මසකට රුපියල් 12,000 ක දීමනාවක් සහ එක් රැස්වීමකට රුපියල් 2,500 ක් බැගින් මසකට රුපියල් 10,000 ක උපරිමයට යටත්ව ගමන් වියදම් දීමනාවක් ද, සාමාජිකයකුට මසකට රුපියල් 10,000 ක දීමනාවක් සහ එක් රැස්වීමකට රුපියල් 2,000 ක් බැගින් මසකට රුපියල් 8,000 ක උපරිමයට යටත්ව ගමන් වියදම් දීමනාවක් ද, ගෙවනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ "ක්වාසි මණ්ඩලය" යනුවෙන් සඳහන් කර 2013 ඔක්තෝබර් මස 26 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය. අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

සිසිර රත්නායක,
ලේකම් (වැඩබලන),
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2013 සැප්තැම්බර් මස 12 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 12.

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### 1965 අංක 1 සහ 1969 අංක 32 දරන පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ ක්වාසි මණ්ඩලයේ සභාපති හා සාමාජිකයින් පත්කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය

1. සම්පූර්ණ නම :

2. මුලකුරු සමග නම :

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය :

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා. හැ. ප. අංකය :

10. දුරකථන අංකය :

11. අධ්‍යාපන සුදුසුකම් :

| | | |
|---|---|---|
| | | |

12. වෘත්තීය සුදුසුකම් :

| | | |
|---|---|---|
| | | |

13. ඉල්ලුම්කරුට කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. ඉල්ලුම්කරුට මුස්ලිම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද ? :

15. විවාහක ද ? :

16. ඔබ නීතිඥවරයෙක් ද ? එසේනම් බඳවාගන්නා ලද දිනය :

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමග) :

| සිට | දක්වා | රැකියාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

18. ඉල්ලුම්කරු සතු දේපල වටිනාකම : රු.

19. මාසික ආදායම : රු.

20. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද :

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද :

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුණේ ද ? තිබේ ද ? :

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිව යුතු පුද්ගලයන් විය යුතු ය) :

| | |
|---|---|
| (1)<br>නම : | (2)<br>නම : |
| ලිපිනය : | ලිපිනය : |
| රක්ෂාව : | රක්ෂාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙහි මාවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

——————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :——————.

සටහන :–

සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

09–1216

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයෙහි තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගය**

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 *බඳවා ගැනීමට අපේක්‍ෂිත තනතුරු*

වගුව - අංක 01 බඳවා ගැනීමට අපේක්‍ෂිත තනතුරු

| *අනු. අංකය* | *තනතුරු නාමය* | | *පිරවීමට තිබෙන පුරප්පාඩු ගණන* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| 1. | සිතියම් තාක්‍ෂණ නිලධාරී | | 212 | පුහුණු කිරීමේ ශ්‍රේණිය |
| 2. | දුරස්ථ ග්‍රහන කාර්මික ශිල්පී | කොළඹ ප්‍රධාන කාර්යාලයේ පමණක් පවතින තනතුරු වේ. මුළු සේවා කාලය තුලම ප්‍රධාන කාර්යාලයේ සේවය කළයුතු වේ. | 06 | පුහුණු කිරීමේ ශ්‍රේණිය |
| 3. | ගුවන් ඡායාරූප ශිල්පී හා රසායනාගාර කාර්මික ශිල්පී | | 01 | පුහුණු කිරීමේ ශ්‍රේණිය |
| 4. | ලිතෝ මුද්‍රණ ශිල්පී | | 05 | පුහුණු කිරීමේ ශ්‍රේණිය |
| 5. | ගොඩනැගිලි පරිපාලක | | 01 | III ශ්‍රේණිය |
| 6. | ප්‍රවාහන නිලධාරී | | 01 | III ශ්‍රේණිය |

1.2 තනතුරු වල රාජකාරි ස්වභාවය

වගුව - අංක 02 තනතුරු වල රාජකාරි ස්වභාවය

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *රාජකාරි ස්වභාවය/ප්‍රධාන කාර්යයන්* |
|---|---|---|
| 1. | සිතියම් තාක්‍ෂණ නිලධාරී | * සිතියම් නිෂ්පාදනය හා ඊට අදාල තාක්‍ෂණ කටයුතු, මැනුම් පිළිබඳ මූලික හා අවසන් කටයුතු සහ ඊට අදාල ලේඛණ පවත්වාගෙන යාම |
| 2. | දුරස්ථග්‍රහන කාර්මික ශිල්පී | * ගුවන් ඡායාරූප හා චන්ද්‍රිකා දත්තයන්ගෙන් අර්ථ නිරූපනය හා විශ්ලේෂණය හා එමගින් සිතියම් සැකසීම, ඒවා පරිගණකගත කිරීම, අවශ්‍ය දත්ත ලබා දීම. |
| 3. | ගුවන් ඡායාරූප ශිල්පී හා රසායනාගාර කාර්මික ශිල්පී | * ගුවන්ගත වී ත්‍රිමාණික ඡායාරූප ගැනීම සහ එම ඡායා ඵලකයන්ගේ විකාශනික කටයුතු සිදු කිරීමත් එම ඡායාපටය ආධාරයෙන් ඡායාරේඛන සඳහා අවශ්‍ය වන ඵලකයන් සැකසීම, විශාලිත ඡායාකරන මුද්‍රණ පිටපත් සෘජුකරණ ඡායාපිටපත් සහ ස්පර්ශිත මුද්‍රණ පිටපත් සකස් කිරීම |
| 4. | ලිතෝ මුද්‍රණ ශිල්පී | * සිතියම් මුද්‍රණය කිරීම |
| 5. | ගොඩනැගිලි පරිපාලක | * වාර්ෂික ගොඩනැගිලි නඩත්තු සැලැස්ම සකස් කිරීම<br>* ගොඩනැගිලි නඩත්තු ක්‍රියාවලිය කළමනාකරණයට යෝජනා කිරීම |

| අනු. අංකය | තනතුරු නාමය | රාජකාරි ස්වභාවය/ප්‍රධාන කාර්යයන් |
|---|---|---|
| | | * සේවක කණ්ඩායම් සුපරීක්ෂාව<br>* නඩත්තු වලට අවශ්‍ය අමුද්‍රව්‍ය, උපකරණ ගබඩා කිරීම හා කළමනාකරණය<br>* ගෙවීම් කටයුතු සඳහා මිනුම් ගැනීම සහ නිර්දේශ ලබා ගැනීම |
| 6. | ප්‍රවාහන නිලධාරි | * දෙපාර්තමේන්තුව සතු වාහන ධාවනයට සුදුසු තත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික තොරතුරු සපයා දීම<br>* අළුත්වැඩියාවන්ට අවශ්‍ය නිර්දේශ හා කාර්මික වාර්තා ලබාදීම<br>* අළුත්වැඩියාවලින් පසු වාහනවල ධාවන තත්වය පරීක්ෂා කිරීම, වාහන නඩත්තුව පිළිබඳ පරීක්ෂා කිරීම<br>* රියදුරන්ට උපදෙස් දීම<br>* රිය අනතුරුවලදී වහා පරීක්ෂා කර බලා වාර්තා ලබාදීම සහ අබලන් වාහන ගර්හිත කිරීම ආදී කටයුතු<br>* පරිසර හිතකාමී සහතික ලබා ගැනීම සඳහා වාහන සැකසීම |

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්වය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප* :-

වගුව - අංක 03

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| පුහුණු කිරීමේ ශ්‍රේණිය (ගොඩනැගිලි පරිපාලක හා ප්‍රවාහන නිලධාරී තනතුරු සඳහා අදාල නොවේ.) | නොමැත | 1 වසර මාසිකව රු. 12,920<br>2 වසර මාසිකව රු. 13,040<br>*රා. ප. ච 06/2006(ii) හි 14 වන ඡේදයේ 09 වන විධිවිධානයට යටත්ව |
| III ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 (එම්එන් 3-2006ඒ) | රු. 15,005 |
| II ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240- 11 x 320 - 20 x 360 - රු. 27,885<br>(12 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ)<br>(එම්එන් 3-2006ඒ) | රු. 17,485 |
| I ශ්‍රේණිය | මාසිකව රු. 15,005-4 x 180 - 6 x 240- 11 x 320 - 20 x 360 - රු. 27,885<br>(23 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ)<br>(එම්එන් 3 - 2006ඒ) | රු. 21,045 |
| විශේෂ ශ්‍රේණිය (ගොඩනැගිලි පරිපාලක හා ප්‍රවාහන නිලධාරි තනතුරු සඳහා අදාල නොවේ.) | මාසිකව රු. 20,030 - 11 x 365 - 18 x 500 -රු. 33,045<br>(එම්එන් 7 - 2006ඒ) | රු. 20,030 |

4.0 මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, සිතියම් තාක්ෂණ නිලධාරි තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය. අනිකුත් තනතුරු කොළඹ ප්‍රධාන කාර්යාලයේ පවතින තනතුරු වන බැවින් මුළු සේවා කාලය තුලම ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතු ය. මෙම ගැසට් නිවේදනයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීම් වලට අදාල වන පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.

5.0 **සුදුසුකම්** :

5.1 *මූලික සුදුසුකම්*

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 30 වේ. (දැනටමත් රජයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.)

5.2 *අධ්‍යාපන සුදුසුකම්*

(අ) භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයන් හය (06) කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් තිබීම;

සහ

(ආ) සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයන් අතරින් විෂයන් දෙක (02) ක් සහිතව විද්‍යා විෂයන් තුන (03) කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

* ගොඩනැගිලි පරිපාලක හා ප්‍රවාහන නිලධාරී තනතුරු සඳහා ඉල්ලුම් කරන්නන් ඉහත 5.1 හා 5.2 සුදුසුකම් වලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් ද ලබා තිබිය යුතු ය.

(1) *ගොඩනැගිලි පරිපාලක*

i. රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ජාතික තාක්ෂණික සහතිකය (සිවිල්) තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව ලබා තිබීම,

ii. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 හෝ 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(2) *ප්‍රවාහන නිලධාරී*

i. රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ජාතික තාක්ෂණික සහතිකය (යාන්ත්‍රික) තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව ලබා තිබීම.,

ii. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 හෝ 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

ඉහත (1) හා (2) හි සඳහන් වෘත්තීය සුදුසුකම්, ප්‍රවාහන නිලධාරී තනතුර සඳහා යාන්ත්‍රික ක්ෂේත්‍රයෙන්ද ගොඩනැගිලි පරිපාලක තනතුර සඳහා සිවිල් ක්ෂේත්‍රයෙන් ද පහත සඳහන් ආයතනයකින් ලබා තිබිය යුතු ය.

(අ) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

(ආ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

*හෝ*

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

*හෝ*

(ඈ) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

(ඉ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම හෝ

(ඊ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.3 *කායික සුදුසුකම්*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*සටහන.*—සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාල සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.0 *සාවද්‍ය තොරතුරු සැපයීම*

මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැතිබව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

7.0 *විභාග පරිපාටිය :*

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය* | *කාලය* |
|---|---|---|---|
| i. බුද්ධි පරීක්ෂණය | 100 | 50% | පැය 01 |
| ii. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | 100 | 50% | පැය 02 |

7.1 *විෂයය නිර්දේශය :*

i. බුද්ධි පරීක්ෂණය : අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය.

ii. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :

ගණිතය :
වීජ ගණිතය (අසමානතා, විචල්‍ය, ශ්‍රේණි, ලඝුගණක) ත්‍රිකෝණමිතිය (සමීකරණ, ත්‍රිකෝණ විසඳීම) සංඛ්‍යානය (මධ්‍යයන්‍ය, මාතය, සම්මත අපගමනය, සම්භාවිතාව)

භෞතික විද්‍යාව :
ආලෝකය හා ප්‍රකාශ විද්‍යාව (පරාවර්තනය සහ වර්තනය : දර්පන වක්‍ර පෘෂ්ඨ, ප්‍රිස්ම කාච ප්‍රකාශ විද්‍යාවේ සූත්‍ර, අන්වීක්ෂය සහ දුරේක්ෂය) නිව්ටන් යාන්ත්‍ර විද්‍යාව (අදිශ සහ දෛශික, චලිතය පිළිබඳ නිව්ටන් නියම, ගම්‍යතාවය)

විවිධ මාතෘකා :
භූගෝල විද්‍යාව හැඳින්වීම (පෘථිවියේ හැඩය, භූ ලක්ෂණ ආදිය)
ඝණ වස්තුවල කෝණික දෘෂ්ටිය සහ ප්‍රක්ෂේපණ ව්‍යුත්පන්න කිරීම.
මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරනු ලබන සිතියම්.

8.0 *තේරීම් පරිපාටිය :*

8.1 මැනුම්පති විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින්, පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන, පළමුව ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල සහ දෙවනුව තනතුර සඳහා පළකරන ලද මනාපය යන කරුණු දෙක අනුව බඳවා ගනු ලැබේ.

8.2 සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

9.0 *බඳවා ගැනීම :*

පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරාගනු ලබන්නන් දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් පවත්වන දෙවසරක, තාක්ෂණ ශිල්පී ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ පසු තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට පත් කෙරේ.

10.0 *අයදුම්පත්‍ර සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :*

(අ) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කරගත යුතු ය. අංක 01 සිට 04 දක්වා ශීර්ෂ 01 පිටුවේද, අංක 04.1 - 10.1 දක්වා ශීර්ෂ 02 පිටුවේ ද, අංක 10.2 - 11.1 දක්වා ශීර්ෂ 03 පිටුවේ ද, අංක 12 - 14 දක්වා ශීර්ෂ 04 පිටුවේ ද, අංක 15 ශීර්ෂ 05 පිටුවේ ද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතු ය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ පෙර ඉදිරිපත් කළ යුතු වේ.

(ඇ) ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

(ඈ) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ඉ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථාන ගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

සැ. යු. : විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10.1 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා 2013.10.31 වැනි දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට මැනුම්පති විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "තාක්‍ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

10.3 අයදුම්පත්‍රයේ අපේක්‍ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

11.0 ***විභාග ගාස්තු :***

විභාග ගාස්තුව රු. 800 කි. මෙම මුදල කොළඹ 05, කිරුල පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය-දියතලාව වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.0 ***අයදුම්පත්‍ර යොමු කිරීම :***

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2013 ඔක්තෝබර් මස 31 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

මැනුම්පති,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 506,
කොළඹ.

13.0 ***විභාගයට පෙනී සිටීම :***
විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු ය.

14.0 ***අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :***

විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
ii. තැපැල්පති විසින් නිකුත් කර ඇති වලංගු හැඳුනුම්පත;
iii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව මැනුම්පති විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

කේ. තවලිංගම්,
මැනුම්පති.

2013 සැප්තැම්බර් මස 03 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

### ආදර්ශ අයදුම් පත්‍රය

*මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය*

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය :

කොළඹ

දියතලාව

අනුරාධපුරය

* විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මධ්‍යස්ථානයේ නම සඳහන් කොටුව තුළ ✓ සලකුණ ද, අනෙක් කොටු දෙක තුළ x සලකුණ ද යොදන්න.

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E)
(දෙන ලද කොටුව තුළ සංකේතය/අංකය යොදන්න)

03. බඳවා ගැනෙන තනතුරු අතරින් පත්වීම ලැබීම සඳහා මනාප අනුපිළිවෙල :
වැඩිම මනාපය සහිත තනතුර සඳහා අංක 01 ද, මනාපය අඩුවන අනුපිළිවෙල අනුව අනෙකුත් තනතුරු සඳහා 02, 03, ........... අනුපිළිවෙලින් මනාප අංකය සටහන් කරන්න.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *මනාප අංකය* |
|---|---|---|
| 1 | සිතියම් තාක්ෂණ නිලධාරි | |
| 2 | දුරස්ථ ග්‍රහන කාර්මික ශිල්පී | |
| 3 | ගුවන් ඡායාරූප ශිල්පී හා රසායනාගාර කාර්මික ශිල්පී | |
| 4 | ලිතෝ මුද්‍රණ ශිල්පී | |
| 5 | ගොඩනැගිලි පරිපාලක | |
| 6 | ප්‍රවාහන නිලධාරි | |

04. මුලකුරු සමග නම :————. (මයා/මිය/මෙනවිය)
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

04.1 මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. උපන් දිනය :

වර්ෂය :————. මාසය:————. දිනය:————.

06.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - M ස්ත්‍රී - F)

08. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :—————.

08.1 ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය (උපලේඛන 1 බලන්න) :

දිස්ත්‍රික් අංකය ☐ දිස්ත්‍රික්කයේ නම ☐

08.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :—————.

09. දුරකථන අංකය ඃ ස්ථාවර :—————. ජංගම :—————.

10. අධ්‍යාපන සුදුසුකම් ඃ

10.1 අ. පො. ස. (සා. පෙ.) විභාගය පිළිබඳ විස්තර :

පළමුවර :

(i) විභාග වර්ෂය හා මාසය :—————.

(ii) විභාග අංකය :—————.

(iii) සමත් වූ විෂයයන් :

වගුව අංක 01—

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

* ලබා ඇති ඉහළම ශ්‍රේණියේ සිට ශ්‍රේණි අනුපිළිවෙලින් විෂයයන් සඳහන් කරන්න.

10.2 අ. පො. ස. (සා. පෙ.) විභාගය පිළිබඳ විස්තර ඃ

දෙවනවර ඃ

(i) විභාග වර්ෂය හා මාසය :—————.

(ii) විභාග අංකය :—————.

(iii) සමත් වූ විෂයයන් :—

වගුව අංක 02 —

| විෂය* | ශ්‍රේණිය | විෂය* | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

* ලබා ඇති ඉහළම ශ්‍රේණියේ සිට ශ්‍රේණි අනුපිළිවෙලින් විෂයයන් සඳහන් කරන්න.

10.3 අ. පො. ස. (උ. පෙ) විභාගය පිළිබඳ විස්තර ඃ

(i) විභාග වර්ෂය හා මාසය :—————.

(ii) විභාග අංකය :—————.

(iii) සමත් වූ විෂයයන් :

වගුව අංක 03—

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

ඔව් ☐ නැත ☐

11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

12. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

13. *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) රු. …………ක් ගෙවා ලබාගත් ලදුපත අදාල ස්ථානයේ අලවා ඇත.

(ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මැනුම්පති විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ……………………………… නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ………… දින මා ඉදිරිපිට දී ඉහත 13 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

15. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය* : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

15.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ,
වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.
සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත,
කිසිදු විනය දඬුවමකට ලක්වා නැත/ඇත.

15.2 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/නොහැකිය.
අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :————.

උපලේඛනය 1

ආදර්ශ අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 08.1 හි සඳහන් ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම ලේඛනය අදාළ වේ.

| | *නගරය/දිස්ත්‍රික්ක නාම* | *නගර/දිස්ත්‍රික්ක අංකය* |
|---|---|---|
| 1. | කොළඹ | 01 |
| 2. | ගම්පහ | 02 |
| 3. | කළුතර | 03 |
| 4. | මහනුවර | 04 |
| 5. | මාතලේ | 05 |
| 6. | නුවරඑළිය | 06 |
| 7. | ගාල්ල | 07 |
| 8. | මාතර | 08 |
| 9. | හම්බන්තොට | 09 |
| 10. | කුරුණෑගල | 10 |
| 11. | පුත්තලම | 11 |
| 12. | අනුරාධපුර | 12 |
| 13. | පොළොන්නරුව | 13 |
| 14. | බදුල්ල | 14 |
| 15. | මොණරාගල | 15 |
| 16. | රත්නපුර | 16 |
| 17. | කෑගල්ල | 17 |
| 18. | අම්පාර | 18 |
| 19. | මඩකළපුව | 19 |
| 20. | ත්‍රිකුණාමලය | 20 |
| 21. | යාපනය | 21 |
| 22. | වවුනියාව | 22 |

09-941

---

**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (රසායනාගාර සහකාර තනතුර සඳහා) පුහුණු කිරීමේ ශ්‍රේණියට බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2013**

* Open Competitive Examination for Recruitment to the post of Laboratory Assistant to the Training Grade of the Sri Lanka Technological Service - 2013

01. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු ශ්‍රේණියේ රසායනාගාර සහකාර තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගය පදනම් කරගෙන සුදුසු අය තෝරාගනු ලැබේ.

03. මෙම තරඟ විභාගය දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය තුළ උපලේඛන අංක 01 හි දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි දී සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ඉල්ලා ඇති අපේක්ෂක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව පෙනී ගියහොත් එම මධ්‍යස්ථානය අවලංගු කොට එකී අපේක්ෂකයන් ආසන්න මධ්‍යස්ථානයකට යොමු කරනු ඇත.

විභාගය පැවැත්වෙන නගර සහ නගර අංක උපලේඛන අංක 01 හි දක්වා ඇත. ඉල්ලුම් පත්‍රයේ අදාළ ශීර්ෂයේ මෙම නගර සහ නගර අංක මෙම උපලේඛනයට අනුව සම්පූර්ණ කළ යුතුය. *ගැසට් නිවේදනය අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර 2 ක් කැමැත්තේ අනුපිළිවෙලින් සඳහන් කරන්න.* ඉල්ලුම් කරන මාධ්‍යය හා නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.*—පුරප්පාඩු සංඛ්‍යාවෙන් 90% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වෙන් කරන අතර එම තනතුරු රජයේ *ගැසට්* නිවේදනයෙන් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා විවෘත තරඟ විභාගයක් පවත්වනු ලැබේ. විභාගයෙන් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවීම් කෙරේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදේ.) අනතුරුව සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ විභාගයේ දී විෂයයන් දෙකෙන් ම උපරිම ලකුණු ගත් අපේක්ෂකයින් තෝරා ඔවුන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම කරනු ලැබේ.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

05.1 බාහිර අයදුම්කරුවන් සඳහා :

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව තව එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම;

සහ

(ආ) විද්‍යාය විෂයය ධාරාව යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සේවයට අදාළ රසායන විද්‍යාව විෂයය ඇතුළුව සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන්ගෙන් විෂයයන් තුන (03) කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම;

හෝ

(ඇ) පැරණි විෂය නිර්දේශය යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සේවයට අදාළ රසායන විද්‍යාව ඇතුළුව ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන්ගෙන් විෂයයන් තුන (03) කින් එකවර සමත් වීම.

05.2 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. (දැනටමත් රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බලනොපානු ඇත.)

05.3 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

05.4 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

05.5 සෑම අයදුම්කරුවෙකු ම තනතුරට අදාළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

*ඉල්ලුම් කළ යුතු පිළිවෙල :*

06. මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍ර ප්‍රකාරව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියේ එක් පැත්තක් ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතුය. නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත් 2013.10.28 දින ට පෙර ලියාපදිංචි තැපෑලෙන් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතු අතර අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "රසායනාගාර සහකාර තනතුර - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව" යන්න සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉල්ලුම්පත් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන හෝ නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද හෝ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍ර වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ. ඉල්ලුම් පත්‍රයේ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය 2/3 වන පිටු වලට ද ඇතුළත් වන ලෙස සකස් කළ යුතු අතර සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය, විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

07. විභාග ප්‍රවේශ පත්‍ර, විභාගය පැවැත්වෙන දිනය හා විභාග කාල සටහන විභාග අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් එවනු ඇත. විභාග අපේක්ෂකයන් විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරනු ලබන කිසිම අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත.

නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඒ සඳහා ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපත් ද ලියාපදිංචි තැපැල් කුවිතාන්සියේ පිටපතක් ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍ර එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සහිතව ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුයි. එම ලිපියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08. ලිඛිත විභාගයේ දී අනන්‍යතාව සහතික කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍ර හෝ පමණක් පිළිගනු ලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

09. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්හට තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරග විභාග සඳහා ප්‍රවේශපතක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ලිඛිත විභාගයේ දී ඉහළම කුසලතාවක් දක්වා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අය පත්වීම් ලබාදීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

10. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණු පිළිබඳව හා පත්වීම් ලබාදීමේ අවසාන තීරණ ගැනීමේ බලය ආණ්ඩුවේ රස පරීක්ෂක සතුය.

11. අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, රු. 2,37,060 කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

12. *විභාග ගාස්තු* :-විභාග ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 600 ක මුදලක් විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003.02.13 අංක දරන ආදායම් ශීර්ෂයට බැර වන සේ ප්‍රාදේශීය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට අයදුම්කරුගේ නමින් ගෙවා ලබා ගත් ලදුපත නොගැලවෙන සේ අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. මුදල් ගෙවූ ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. *ලිඛිත විභාගය* :-මෙම තරග විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය වලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය. ලිඛිත විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

(1) බුද්ධි පරීක්ෂණය,
(2) රසායන විද්‍යාව (තාක්ෂණ ප්‍රශ්න පත්‍රය)

14. *විෂය නිර්දේශය* :

(1) බුද්ධි පරීක්ෂණය : කාලය පැය 01 කි මුළු ලකුණු 100 යි
මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වන අතර එම සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුවේ.
අපේක්ෂකයාගේ තර්කන හැකියාව, සංඛ්‍යාමය හැකියාව, විශ්ලේෂණ හැකියාව හා සාමාන්‍ය බුද්ධිය මැන බැලෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.

(2) රසායන විද්‍යාව (තාක්ෂණ ප්‍රශ්න පත්‍රය) : කාලය පැය 02 කි. මුළු ලකුණු 100 යි.

මෙම ප්‍රශ්න පත්‍රය ව්‍යුහගත රචනා මාදිලියේ ප්‍රශ්නවලින් යුක්ත වන අතර, සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. අ.පො.ස. (උ. පෙළ.) විභාගයේ රසායන විද්‍යාව විෂය නිර්දේශයෙහි අඩංගු ඉහත තනතුරට අදාළ වන ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.

15. *තේරීම් පරිපාටිය* :
සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයකින් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලබාගත යුතුය. මෙම විභාගයෙන් සුදුසුකම් ලැබූවන්ගෙන් වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින්, සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දෙනු නොලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ විභාගයේ දී විෂයන් දෙකෙන් ම උපරිම ලකුණු ලබා ගත් අපේක්ෂකයින් තෝරා ඔවුන් පුහුණු කිරීමේ ශ්‍රේණියට පත්කරනු ලැබේ.

16. පහත සඳහන් ලියවිලි අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින්ට නියම කෙරෙනු ඇත.

(අ) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සහ තාක්ෂණික සහතික පත්‍ර,
(ආ) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන උප්පැන්න සහතිකය,
(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික තුන (03) ක් (මින් දෙක (02) ක් අන්තිම වරට ඉගෙන ගත් පාසලේ විදුහල්පතිගෙන් සහ පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.)

17. වෛද්‍ය පරීක්ෂණය :
තෝරාගත් අයදුම්කරුවන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික යෝග්‍යතාවකින් යුක්තබව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් නුසුදුස්සන් වනු ඇත.

18. වැටුප් ක්‍රමය :
(අංක 6/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ඊට අදාළ සංශෝධනවලට අනුව) පුහුණු කිරීමේ ශ්‍රේණිය -MN 1-2006ඒ - රු. 13,120 - 1 x 145 - රු. 13,265
රසායනාගාර සහකාර II 'ආ' බාණ්ඩය - MN3 2006 ඒ - රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු 27,885

සටහන.—පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවාගනු ලබන අයදුම්කරුවන් සේවයට අදාළ විෂයය නිර්දේශයට අනුව ලබා ගන්නා අවුරුදු දෙක (02) ක න්‍යායාත්මක හා ප්‍රයෝගික පුහුණු කාල සීමාව අවසානයේ දී පවත්වනු ලබන විභාගයෙන් සමත් වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වැනි පන්තයේ 'ආ' බණ්ඩයට පත් කෙරේ.

19. සේවා කොන්දේසි :

19.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වසර 02 පුහුණු කාලසීමාවෙන් අනතුරුව පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත්වන අතර තෝරා ගනු ලබන අය වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

19.2 තෝරාගනු ලබන්නන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව, ආයතන සංග්‍රහයේ ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රෙගුලාසි හා රජය මගින් දැනට නිකුත් කර ඇති කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

19.3 රාජ්‍ය භාෂා නොවන භාෂා මාධ්‍යයකින් බඳවාගත් නිලධාරියකු පත් කළ දින සිට අවුරුදු 03 ක් ඇතුළත රාජ්‍ය භාෂා පරීක්ෂණයෙන් සමත් විය යුතුය. නියමිත කාලය තුළ මෙම පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වීම ඊළඟ වැටුප් වර්ධකය විලම්බනය වීමට හේතුවනු ඇත.

19.4 ස්ථිර පත්වීමේ දින සිට වසර 05 ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 හි දැක්වෙන පරිදි තම තනතුරට අදාළ වන මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු වේ. අදාළ කාලය තුළ එම ප්‍රවීණතාව ලබා ගැනීමට අපොහොසත් වුවහොත් එම ප්‍රවීණතාව ලබාගන්නා තුරු වැටුප් වර්ධක නතර කෙරේ.

19.5 1589/30 අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටි රීතිවල සඳහන් බඳවා ගැනීම සඳහා වූ කොන්දේසි අදාළ වේ.

19.6 විශේෂ :

(i) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් රාජකාරි භාර ගැනීමට පෙර අවුරුදු 07 ක අවම සේවා කාලයක් සේවය කරන බවට ද ඔහු/ඇය එම කාලය දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් රු. 2,50,000 ක වලංගු මුදලක් හා ඒ දක්වා නිලධාරියා වෙනුවෙන් රජය මගින් වැය කරන ලද වැටුප් දීමනා ඇතුළු සියලු වියහියදම් ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයට ගෙවන බවට ද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පිළිගන්නා වූ ඇපකරුවන් දෙදෙනෙක් ද සහිතව බැඳුම්කරයක් ලියා අත්සන් කළ යුතුය.

(ii) ඔවුන් දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කළ යුතු වේ.

20. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වන්නේය.

ඩබ්. ඩී. ජී. එස්. ගුණතිලක,
ආණ්ඩුවේ රස පරීක්ෂක.

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව,
අංක 31, ඉසුරු මාවත,
පැලවත්ත,
බත්තරමුල්ල.

උපලේඛනය 01

විභාගය පවත්වන නගර හා නගර අංක :

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| මාතර | 03 |
| කුරුණෑගල | 04 |
| අනුරාධපුර | 05 |
| රත්නපුර | 06 |
| බදුල්ල | 07 |
| යාපනය | 08 |
| මඩකලපුව | 09 |

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (රසායනාගාර සහකාර තනතුර සඳහා) පුහුණු කිරීමේ ශ්‍රේණියට බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2013

Open Competitive Examination for Recruitment to the post of Laboratory Assistant to the Training Grade of the Sri Lanka Technological Service - 2013

01. (අ) විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල -2
(කොටුව තුළ අදාළ අංකය යොදන්න) දෙමළ - 3
ඉංග්‍රීසි -4 ☐

(ආ) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය :

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

(ගැසට් නිවේදනයේ උපලේඛන අංක 01 අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපෙක්ෂා කරන නගරය සහ නගර අංකය කැමැත්තේ අනුපිළිවෙලින් සඳහන් කරන්න.)

02. (අ) මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම ඉංග්‍රීසියෙන් : උදා. (SILVA A. B. C.)
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

| | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) මුල'කුරු අගට යොදා මුල'කුරු සමග නම : (සිංහලෙන්/දෙමලෙන්)
:—————.මහතා/මෙනෙවිය/මහත්මිය

(ඇ) මුල'කුරුවලින් හැඳින්වෙන නම් : (සිංහලෙන්/දෙමළෙන්):—————.

(ඈ) මුල'කුරුවලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසියෙන් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි.)

| | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |

03. ස්ථිර ලිපිනය :
(අ) (සිංහලෙන්/දෙමළෙන්)

| | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) ඉංග්‍රීසියෙන් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

| | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | |

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ඇත.)

(ඇ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

(ඈ) ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය :————.

(ඉ) ඔබගේ දුරකථන අංකය :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී 1
පුරුෂ -0
*(කොටුව තුළ අදාළ අංකය යොදන්න)*

05. විවාහක අවිවාහක බව : විවාහක - 1
*(කොටුව තුළ අදාළ අංකය යොදන්න)* අවිවාහක - 2

06. ජනවර්ගය :
සිංහල - 1
ද්‍රවිඩ - 2
වෙනත් - 3
*(කොටුව තුළ අදාළ අංකය යොදන්න)*

07. ජාතික හැඳුනුම්පත් අංකය :

08. (අ) උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

(ආ) 2013.10.28 වැනි දිනට වයස : අවුරුදු : මාස : දින :

09. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස. (සා .පෙළ) විභාගය :

*පළමුවන වර*
වර්ෂය :————.
විභාග අංකය :————.

*දෙවන වර*
වර්ෂය :————.
විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාගය :
වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

10. වෘත්තීය සුදුසුකම්/තාක්ෂණික සුදුසුකම් ඃ

    9.1 ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව :————.
    9.2 අදාළ උපාධිය/ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනයේ නම :————.
    9.3 අදාළ උපාධිය/ඩිප්ලෝමාව වලංගු වන දිනය :————.

11. වෙනත් සුදුසුකම් :————.

12. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේද? ඔව්/නැත

    12.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න :————.

13. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ රැකියාවක් කරන්නේ නම් තනතුරේ නම, සේවය කරන දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය :————.

14. අයදුම්කරු මීට පෙර රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ රැකියාවක් කර ඉවත් වී සිටින අයකු නම් එසේ ඉවත් වීමට හේතුව :————.

15. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :
    15.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලයේ නම :————.
    15.2 ලදුපත් අංකය :————.
    15.3 මුදල් ගෙවූ දිනය :————.

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත නොගැලවෙනසේ අමුණන්න.<br>(ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න.) |

16. *අයදුම්කරුගේ ප්‍රකාශය ඃ*

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීම හා විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි. මෙම විභාගයේ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් අපේක්ෂත්වය අවලංගු කිරීමට හෝ පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි. තව ද මෙම විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් ගනු ලබන තීරණවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

17. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.........................මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බව ඔහු/ඇය ....................... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහිතක කරන නිලධාරියාගේ අත්සන,

නම :————.
තනතුර :————.
ලිපිනය :————.

දිනය :————.

(මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.)

මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත තොරතුරු සඳහන්. ................................ මහතා/මහත්මිය/මෙනෙවිය....................... කාර්යාලයේ සේවය කරන බව ද ඔහු/ඇය .......................දින සිට .................... තනතුරක සේවය කරන බව ද ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද මෙම විභාගයේ ප්‍රතිඵල මත පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරන බව ද/නොකරන බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.

දිනය ෑ

(මෙය දැනටමත් මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුතු අයට පමණක් අදාළ වේ.)

09-1125

---

## ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 (II)

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් වෛද්‍ය නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කොළඹ දී පැවැත් වේ.

1. ආයුර්වේද කොමසාරිස් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

2. ඉල්ලුම්පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතිවලට අනුකූලව සකස්කර එවිය යුතුය. එම ආදර්ශ ආකෘතිය අනුව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවට අදාළව සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කළ යුතු අතර, එම අයදුම්පත්‍රය අපේක්ෂකයින් විසින් සිය ආයතන ප්‍රධානියා මගින් 2013.10.15 දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේඛකාධිකාරි, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් එවනු ලබන ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(II)" යනුවෙන් සඳහන් විය යුතුය. අයදුම්පත්‍රය කැඳවන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමුවරට මෙම විභාගයට පෙනී සිටීමට කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත්, ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 200 ක් වටිනා මුද්දර ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 50 ක් බැගින් වටිනා මුද්දර ද අයදුම්පතෙහි අලවා තම අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය. මොනම කරුණක් යටතේ වුව ද එම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

3. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය* ෑ-
අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී සහ පෙනීසිටින සෑම විෂයයක් පාසාම ආයුර්වේද දෙපාර්තමේන්තුව සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතරින් කුමක් වුවත් භාර ගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

4. අයදුම්පත් පිළිගන්නා ලද නිලධාරීන් වෙත ආයුර්වේද කොමසාරිස් විසින් විභාග කාලසටහන සහ ප්‍රවේශ පත්‍රය නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් අත්සන නියමිත පරිදි සහතික කරවා ගන්නා ලද ප්‍රවේශ පත්‍රය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශපත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව පහත සඳහන් විස්තර සමග "ලේඛකාධිකාරි, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" යන ලිපිනයට වහාම දැන්විය යුතු ය.

(i) විභාගයේ නම :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(iii) අයදුම්කරුගේ ලිපිනය :————.

(iv) අයදුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලයේ නම සහ ලියාපදිංචි කුවිතාන්සියේ අංකය හා දිනය :————.

5. *විභාග පරිපාටිය* ෑ
(ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් සේවා ව්‍යවස්ථාවට අනුකූලව)

I. *මුදල් රෙගුලාසි*.-පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ i වැනි කාණ්ඩය (10 පරිච්ඡේදය හැර)

II. *ආයතන සංග්‍රහය*.— පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ පළමුවෙනි කාණ්ඩයේ I, II, III, IV, V, VI, VII, VIII, XII, XIII, XIV, XXIII, XXVII, XXIX, XXX,

XXXII පරිච්ඡේද සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය පිළිබඳ දැනුම.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවෙනි කාණ්ඩයේ XLVII සහ XLVIII පරිච්ඡේද.

III. *ආරෝග්‍යශාලා පරිපාලනය*.-පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්

(i) ආරෝග්‍යශාලා පිළිබඳ පැවැත්වෙන සාමාන්‍ය නීති රීති
(ii) ආරෝග්‍යශාලාව පිරිසිදුව තබා ගැනීම
(iii) රෝගීන් සම්බන්ධව බලපැවැත්වෙන නීති රීති
(iv) රෝගීන්ට නියමිත ආහාර පාන ලබා ගන්නා විධි
(v) ඖෂධ නිෂ්පාදනාගාර පාලනය
(vi) රෝගීන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීති රීති
(vii) ආරෝග්‍යශාලාවල වෛද්‍ය අධිකාරිගේ සිට අනෙකුත් කණිෂ්ඨ සේවකයින් දක්වා ඔවුන්ට අයත් රාජකාරි පිළිබඳව ඇති අවබෝධය
(viii) ආරෝග්‍යශාලාවල සාමාන්‍ය පාලන කටයුතු
(xi) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පාලන රෙගුලාසි
(x) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් පිළිබඳ නීතිරීති
(xii) ආයුර්වේද කාර්ය සංවිධාන සංග්‍රහය

IV. *රාජ්‍ය භාෂා වාචික පරීක්‍ෂණය* - සිංහල/දෙමළ (විනාඩි 15)

(i) සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා-
(*අ*) දෙමළ භාෂාවෙන් අසන ප්‍රශ්නවලට දෙමළ භාෂාවෙන් පිළිතුරු දීම;
(*ආ*) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම;
(*ඇ*) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

(ii) දෙමළ භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා-

(*අ*) සිංහල භාෂාවෙන් අසන ප්‍රශ්නවලට සිංහල භාෂාවෙන් පිළිතුරු දීම;
(*ආ*) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම;
(*ඇ*) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

විභාගය සමත් වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතු ය.

පී. එස්. කේ. ආර්. වීරකෝන්,
ආයුර්වේද කොමසාරිස්,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.

2013 සැප්තැම්බර් මස 09 වැනි දින,
ආයුර්වේද දෙපාර්තමේන්තුව,
නාවින්න, මහරගම.

ආදර්ශ අයදුම් පත්‍රය

ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය - 2013 (II)

විභාග අංකය : [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

විභාගයට පෙනී සිටින මාධ්‍යය : [ ]

(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)
සිංහල - S, දෙමළ - T

01. මුලකුරු සමග නම (Mr./Mis./Miss) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. මුලකුරු සමග නම :————. මයා/මිය/මෙනවිය
(සිංහලෙන්/දෙමළෙන්)

03. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

04. මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
(සිංහළෙන්/දෙමළෙන්)

05. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

06. (i) සේවා ස්ථානය හා ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ii) සේවා ස්ථානය අයත් පළාත :————.
07. (i) සේවා ස්ථානය හා ලිපිනය :————.
(සිංහලෙන් හෝ දෙමළෙන්)
(ii) දුරකථන අංකය :————.
08. (i) දැනට දරන තනතුර :————.
(ii) පත්වීම් ලිපියේ අංකය හා දිනය :————.

09. ඔබ දැන් ඉදිරිපත් වන විෂය/විෂයයන්

| *අනු. අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10. ඔබ මින් ඉහත විභාගයක දී පහත සඳහන් විෂයයන් එකකින් හෝ කිහිපයක් හෝ සමත් වී තිබේද? මුදල් රෙගුලාසි/ආයතන සංග්‍රහය/ආරෝග්‍යශාලා පරිපාලනය/වාචික පරීක්ෂණය (දෙමළ/සිංහල) එසේ නම් විභාග අංකය හා දිනය සඳහන් කරන්න.

| *විෂයය* | *විභාග* | *වර්ෂය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

11. ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————. විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් අලවන ලද මුද්දරවල වටිනාකම

*මුද්දර කොටුව* :

| |
|---|
| සම්පූර්ණ විභාගය සඳහා රු. 200 ක් වටිනා මුද්දර ද, එක් එක් විෂයයක් සඳහා නම් රු. 50 ක් බැගින් වටිනා මුද්දර ද මෙහි අලවන්න. |

*සංලක්ෂ්‍යය.*— අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නියමිත වටිනාකමින් යුත් මුද්දර ඔහුගේ/ඇයගේ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතුයි. මුද්දර එකපිට එක නොඇලවිය යුතුයි.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතත් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙහි අලවා ඇති රු....... ක මුද්දර පාවිච්චි නොකරන ලද වලංගු ඒවා බවත් සහතික කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති රීති පිළිබඳව මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන.*—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කල යුතුය.

අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .................. මහතා/මහත්මිය/මෙනවිය ...... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

09-1093

---

## නීතිපති දෙපාර්තමේන්තුවේ ලඝු ලේඛක III පන්තියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013

නීතිපති දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) ලඝුලේඛක III වන පන්තියේ සිංහල මාධ්‍ය තනතුරු - 14
(ආ) ලඝුලේඛක III වන පන්තියේ ඉංග්‍රීසි මාධ්‍ය තනතුරු - 12
(ඇ) ලඝුලේඛක III වන පන්තියේ දෙමළ මාධ්‍ය තනතුරු - 02

02. *අයදුම්පත් භාර ගැනීම.*—මෙම ගැසට් නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව 'ඒ4' ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින් අයදුම්පත් සකස්කර ගත යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 3.0 තෙක් පළමුවන පිටුවට ද 4.0 සිට 8.0 තෙක් දෙවන පිටුවටද ඉතිරිය තුන්වන පිටුවට ද වන ලෙස පිළියෙල කර, ඊට අදාළ තොරතුරු තම අත්අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කල යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද ආදර්ශ අයදුම්පත්‍රය පිළියෙල කිරීමේදී අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීම අත්‍යාවශ්‍යය වේ. අපේක්ෂකයා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත, 2013.10.25 වැනි දින හෝ ඊට පෙර ලැබෙනසේ "නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව. තැ. පෙ. 502 කොළඹ 12" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(අ) අයදුම්පත් එවීමේදී "ලඝු ලේඛක තනතුරු සඳහා බඳවා ගැනීම 2013" යනුවෙන් අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කළ යුතුය.

(ආ) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් නියමිත දිනට පෙර එවිය යුතුය.

(ඇ) අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්පත් හෝ ඊට සම්බන්ධ වෙනත් ලියවිල්ලක්, තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

(ඈ) අදාළ ආකෘතියට අනුකූල නොවන, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. *අනන්‍යතාවය.*—තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛණයක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

04. *සාවද්‍ය තොරතුරු.*—අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව අනාවරණය වුවහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කරනු ඇත.

05. *මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය.*—රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) අනුව, MN1-2006(ඒ) රු. 13,120-10x145-11x170-10x240-10x320- රු.22,040 වන අතර වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන අනුවය. තනතුරට පත්වීමෙන් පසු හතර වන වැටුප් පියවර එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

06. *විභාග ගාස්තු.*—මෙම විභාගය සඳහා ගාස්තු රු. 350 කි. එම විභාග ගාස්තුව "නීතිපති" නමින් ලංකා බැංකුව වැල්ලවත්තේ ශාඛාවේ අංක 0007041486 දරන ගිණුමට බැර කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නිසි කොටුවේ අලවා (නිකුත් කල බැංකු ශාඛාව, අංකය හා දිනය සඳහන් කර) තිබිය යුතුය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක්

මත ආපසු ගෙවනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

07. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

08. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. පත් කිරීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

2009.02.20 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද අංක 1589/30 දරන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

(ii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු තෝරා ගනු ලැබුහොත්, ඔහු/ඇය එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ලැබේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළ ලබා ගත යුතු ය.

(iv) කොළඹ 12, නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු ය.

9. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

(i) *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ගණිතය සහ සිංහල/ඉංග්‍රීසි/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 04කට අවම වශයෙන් සම්මාන සහිතව එක් වරකදී විෂයයන් 06ක් සමත්ව තිබීම.

*සහ*

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (නව විෂය නිර්දේශය යටතේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) අවම වශයෙන් එක් විෂයයකින් හෝ සමත්ව තිබීම.

(ii) *වෘත්තීය සුදුසුකම් :*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා යතුරු ලියනය හා ලඝුලේඛනය පිළිබඳ මාස හයකට (06) නොඅඩු පාඨමාලාවක්, අයදුම් කරනු ලබන තනතුරට අදාළ භාෂා මාධ්‍යයෙන්ම හදාරා තිබීම.

(iii) *පළපුරුද්ද :*

(අ) අධිකරණයක/කම්කරු විනිශ්චය සභාවක මාස හයකට (06) නොඅඩු කාලයක් අනියම්, කොන්ත්‍රාත් හෝ පුහුණු ලඝුලේඛක ලෙස කටයුතු කර තිබීම.

*හෝ*

(ආ) රජය විසින් පිළිගත් ආයතනයකින් මාස හයකට (06) නොඅඩු කාලයක් ප්‍රායෝගික පුහුණුවක් ලබා තිබීම.

10. අයදුම්කරුවන් විසින් මෙහි පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් අවශ්‍ය අවස්ථාවකදී ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර තබාගත යුතු ය.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.

11. *පත්වීම සඳහා තෝරාගනු ලබන අන්දම.*—මෙම බඳවා ගැනීමේ විවෘත තරග විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා වෘත්තීය පරීක්ෂණයකින් සමන්විතය. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන අතර සමත්වීම සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකටම ලකුණු සියයට හතලිහක් (40%) හෝ ඊට වැඩියෙන් ලබා ගත යුතු ය. සමත් අයදුම්කරුවන් අතුරින් ඉහළම ලකුණු ලබාගත් අනුපිළිවෙළට, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයෙන් ද ලකුණු සියයට හතලිහක් (40%) හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින්, ඔවුන්ගේ මුළු ලකුණුවල එකතුවට අනුව කුසලතා පදනම මත තෝරාගනු ලැබේ. (මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සියල්ලම සපුරා තිබීම අනිවාර්ය වේ.)

(i) අයදුම්කරුවන් තනතුරු සඳහා අයදුම් කරන භාෂා මාධ්‍යයෙන්ම විභාගයට පෙනී සිටිය යුතු ය. (*උදා :* ඉංග්‍රීසි මාධ්‍ය තනතුරු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන්ම විභාගයට පෙනී සිටිය යුතු ය.) ඉල්ලුම් කරනු ලබන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) සිංහල මාධ්‍ය අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සිංහල මාධ්‍ය තනතුරු සඳහා ද, ඉංග්‍රීසි මාධ්‍ය අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව අනුව ඉංග්‍රීසි මාධ්‍ය තනතුරු සඳහා ද, දෙමළ මාධ්‍ය අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව අනුව දෙමළ මාධ්‍ය තනතුරු සඳහා ද පත් කිරීම සිදු කරනු ලැබේ.

(iii) මෙම විභාගය 2013 නොවැම්බර් මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

12. තෝරා ගැනීමේ ක්‍රමය :

12.1 ලිඛිත විභාගය

| *ප්‍රශ්න පත්‍රය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|
| (i) බුද්ධි පරීක්ෂණය | 100 | පැය 02 |
| (ii) සාමාන්‍ය දැනීම | 100 | පැය 02 |

(i) *බුද්ධි පරීක්ෂණය :*

පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයින් දක්වන නිගමන, ප්‍රතිචාර ආශ්‍රයෙන්, එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය, කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂයෙකු සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(ii) *සාමාන්‍ය දැනීම :*

ජාතික, කලාපීය හා සමස්ථ ලෝකයේ විවිධ සංවිධාන පරිසරය තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

12.2 *වෘත්තීය පරීක්ෂණය* :

| | *ප්‍රශ්න පත්‍රය* | *ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| (i) | සිංහල/දෙමළ ලඝු ලේඛනය | 100 | 40 |
| (ii) | ඉංග්‍රීසි ලඝු ලේඛනය | 100 | 40 |

(i) *සිංහල/දෙමළ ලඝු ලේඛනය* :

(*අ*) විනාඩි පහක් (05) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් විනාඩියකට වචන 70ක වේගයෙන් ලඝු සටහන් කර, එම සටහන විනාඩියකට වචන 08ක වේගයෙන් යතුරු ලියනය කිරීම;

*සහ*

(*ආ*) විනාඩියකට වචන 30ක අවම වේගයෙන් විනාඩි 20ක් යතුරු ලිවීම.

(ii) ඉංග්‍රීසි ලඝු ලේඛනය :

(*අ*) විනාඩි පහක් (05) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් විනාඩියකට වචන 80ක වේගයෙන් ලඝු සටහන් කර, එම සටහන විනාඩියකට වචන 08ක වේගයෙන් යතුරු ලියනය කිරීම;

*සහ*

(*ආ*) විනාඩියකට වචන 40ක අවම වේගයෙන් විනාඩි 20ක් යතුරු ලිවීම.

13. *විභාගයට පෙනී සිටීම.*—විභාගය පැවැත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත ඔවුනගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම්, ඒ බව නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද සමග විමසීම වඩාත් ඵලදායී වනු ඇත.

14. විභාග අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, සන්නද්ධ හමුදාවන්හි අධිකාරලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 240,360 ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

15. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන සියලුම නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝණය කළහොත් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

16. මෙම විභාගය පැවැත්වීම, පත්වීම් ලබාදීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය නීතිපති සතු වන්නේ ය.

*සටහන.*—මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවී ඇති නිවේදන අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල මාධ්‍ය බලපැවැත්විය යුතු බව කරුණාවෙන් සලකන්න.

එස්. පාලිත ප්‍රනාන්දු,
ජනාධිපති නීතිඥ
නීතිපති.

2013 සැප්තැම්බර් මස 27 වැනි දින,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

*ආදර්ශ අයදුම්පත්‍රය*

*නීතිපති දෙපාර්තමේන්තුවේ ලඝුලේඛක III පන්තියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013*

*The Open Competitive Examination for the Recruitment to the Post of Stenographer (Grade III) in the Attorney General's Department - 2013*

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (උදා : Perera A. B. C.)

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) පුරුෂ 0

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

2.4 දුරකථන අංකය :————.

3.0 3.1 විවාහක/අවිවාහක බව : විවාහක - 2 අවිවාහක - 1

අදාළ කොටුව තුළ ලියන්න.

3.2 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

3.4 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද? :—————.

4.0 *අධ්‍යාපන සුදුසුකම් :*

4.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය :

(i) විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :—————. මාසය :—————.

(ii) විභාග අංකය :—————.

(iii) ප්‍රතිඵල :—————.

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

4.2 අ. පො. ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :—————. මාසය :—————.

(ii) විභාග අංකය :—————.

(iii) ප්‍රතිඵල :—————.

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

5.0 *වෘත්තීය සුදුසුකම් :*

| *පාඨමාලාවේ නම* | *කාල සීමාව* | *ආයතනය* |
|---|---|---|
| | | |

6.0 *පළපුරුද්ද :*

| *පුහුණුව ලැබූ හෝ සේවය කළ ආයතනයේ නම* | *කාල සීමාව* |
|---|---|
| | |

7.0 ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේද? (අදාළ කොටුවේ (✓ ) ලකුණ යොදන්න)

| ඔව් | ☐ | නැත | ☐ |
|---|---|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න.

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ ලංකා බැංකු ශාඛාවේ නම :—————.

(ii) කුවිතාන්සි අංකය හා දිනය :—————.

(iii) ගෙවූ මුදල :—————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

9.0 *අයදුම්කරුගේ සහතිකය :*

(*අ*) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳ දරා ගැනීමට මම එකඟ වෙමි. තවද, මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(*ආ*) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයක් පිළිගැනීමට මම එකඟ වෙමි.

(*ඇ*) මවිසින් කරන ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු වුවද සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

(*ඈ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

10.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................... මයා/මිය/මෙනෙවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ........... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

—————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

11.0 *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :
(දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට පමණක් අදාළ වේ.)

…………………… මයා/මිය/මෙනෙවිය ………… සේවයේ නියුතු ………… තනතුර දරන නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත්, ………… සේවයෙන් ඔහු/ඇය මුදාහැරිය හැකි/නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

09-1153

---

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා වූ I වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010/2011 (2013)**

ඉහත සේවාවේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2014 ජනවාරි මස ආරම්භ කොට කොළඹ දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2013 වසරේ මැයි මස 31 දිනට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවාවේ යෙදී සිටින නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකි වන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. *විෂය නිර්දේශ* .— I වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට අදාළ විෂයය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත. ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවාවේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග I සඳහා වූ විෂයය නිර්දේශය ඇමුණුම "අ" හි ද කාර්යක්ෂමතා කඩඉම් II සඳහා වූ විෂයය නිර්දේශය ඇමුණුම "ආ" හි ද සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය :-

ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරී සේවය

*I වැනි කාර්යක්ෂමතා කඩඉම*

| *විෂයය අංකය* | *විෂයය* | *කාලය (පැය)* |
|---|---|---|
| 01 | කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය | 02 |
| 02 | මුදල් රෙගුලාසි | 02 |

*II වැනි කාර්යක්ෂමතා කඩඉම*

| *විෂයය අංකය* | *විෂයය* | *කාලය (පැය)* |
|---|---|---|
| 03 | කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය | 02 |
| 04 | මුදල් රෙගුලාසි | 02 |

*සටහන*.— "එක් එක් විෂයය සඳහා මුළු ලකුණු සංඛ්‍යාව 100ක් බැගින් වන අතර, I වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකෙන්ම සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් හෝ ලබාගත යුතුය."

05. පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළත්වීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාවය.

06. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පැවැත්වෙන අතර, අපේක්ෂකයෙකු පෙනී සිටින සෑම විෂයයක් සඳහාම එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගවලට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර, අනුබද්ධ ආකෘතියට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතුය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත් අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුනහොත් ප්‍රතික්ෂේප වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ. ඉහත සඳහන් විභාග දෙකටම පෙනී සිටින්නේ නම්, වෙන වෙනම එක් එක් විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

10. ඉල්ලුම්පත්‍ර 2013 ඔක්තෝම්බර් මස 25 වැනි දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි ආයතන ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායි වනු ඇත.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සළකා බලනු නොලැබේ.

13. හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත්කර ඇති 1971 ජූනි මස 29 වැනි දින අංක එස්ඊ 274 දරන චක්‍රලේඛය කෙරෙහි සියළුම අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ. විභාගශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වනු ඇත. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් **ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය** හෝ පමණි. විභාගය ආරම්භ වන දිනයේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත :

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

| | |
|---|---|
| (ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා— | රු. ශත |
| සම්පූර්ණ විභාගය සඳහා | 400 0 |
| එක් විෂයයකට | 100 0 |

එම ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන සේ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

මෙම විභාගයට දැනටමත් පෙනී සිටි අපේක්‍ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ.

කේ. එම්. ටී. කැඳරාගම,
ලේකම්,
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 09 වැනි දින,
කොළඹ 03,
අංක 45, ශාන්ත මයිකල් පාර.

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

***සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ***

***ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන් සඳහා වූ I වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2010/2011 (2013)***

*Department of Animal Production and Health*

Efficiency Bar Examination I and II for the Officers in the Sri Lanka Livestock Development Officers' Service — 2010 /2011 (2013)

(විභාගයේ නම ලිපිකවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)

01. නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- සිංහල - 2 ☐
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාල අංකය කොටුව තුළ ලියන්න.)

02. නිලධාරියා ඉල්ලුම්කරන විභාගය : ☐
(අදාල අංකය කොටුව තුළ ලියන්න.)

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 1
දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2

03. (අ) මුල'කුරු අගට යොදා මුල'කුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා :-FERNANDO, B. A.) :———.

(ආ) මුල් අකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.

04. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිළිව) සඳහන් කළ යුතුය.

(i) විෂය අංකය : ☐☐ විෂයය :———.

(ii) විෂය අංකය : ☐☐ විෂයය :———.

07. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

08. පදවි නාමය :———.

දෙපාර්තමේන්තුවේ නම :———.

09. ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවාවට පත්කරන ලද දිනය :———.

10. මෙයට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම්, විෂයයන් ද වර්ෂය හා මාසය ද සඳහන් කරන්න. :———.

අයදුම්කරුගේ සහතිකය :-

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

_______,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :———.

11. ගෙවන ලද විභාග ගාස්තුව ፡ රු.

| මුදල් ගෙවූ රිසිට් පත මෙහි අලවන්න. |
|---|

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මගින්
විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙහි විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

* අපේක්ෂකයා/අපේක්ෂිකාව රු. ............ වටිනා විභාග ගාස්තු නිසි පරිදි ගෙවා ඇති බව ද, අදාළ ලදුපත අලවා ඇති බවද සහතික කරමි. අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

__________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
පදවි නාමය.

දිනය :———.

(*ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතුය)

**"අ" ඇමුණුම**

(අ) ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ :—

1. කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය (මුළු ලකුණු 100 කි.)
2. මුදල් රෙගුලාසි (මුළු ලකුණු 100 කි.)

**1. කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය**

කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ. :-

ආයතන සංග්‍රහය පරිච්ඡේද II, III, IV, V, VIII, XII, XIII, XIV, XIX, XLVIII.

* සටහන.— සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% ක් හෝ ඊට වැඩියෙන් හෝ අපේක්ෂකයකු විසින් ලකුණු ලබාගත යුතුය.

**2. මුදල් රෙගුලාසි**

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ :-

**I වැනි පරිච්ඡේදය**
වියදම් හා ආදායම් ඇස්තමේන්තු
ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම (මු. රෙ. 1 සිට 68 දක්වා)

**III වැනි පරිච්ඡේදය**
මූල්‍ය කළමනාකරණය හා උත්තරාදායී බව
ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්, ගණන්දීමේ නිලධාරින්, ආදායම් ගිණුම් නිලධාරින්, ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම කාර්ය පැවරීම (මු. රෙ. 124 සිට 147 දක්වා)

* සටහන.— සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% ක් හෝ ඊට වැඩියෙන් හෝ අපේක්ෂකයකු විසින් ලකුණු ලබාගත යුතුය.

ඉහත විෂයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.

"ආ" ඇමුණුම

(අ) ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන් සඳහා වූ 2 වැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ. :—

1. කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය (මුළු ලකුණු 100 කි.)
2. මුදල් රෙගුලාසි (මුළු ලකුණු 100 කි.)

**1. කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය**

කාර්යාල පරිපාලනය සහ ආයතන සංග්‍රහය පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ. ඃ

ආයතන සංග්‍රහය ඃ පරිච්ඡේද XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XLVII, XLVIII.

නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම් පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ වේ.

* සටහන.- සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% ක් හෝ ඊට වැඩියෙන් හෝ අපේක්ෂකයකු විසින් ලකුණු ලබාගත යුතු ය.

**2. මුදල් රෙගුලාසි**

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ. ඃ

**VI වැනි පරිච්ඡේදය**

ආණ්ඩුවේ මුදල් යනාදිය භාරකාරත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම් රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව, බැංකු ගිණුම් (මු. රෙ. 315 සිට 396 දක්වා)

**XIII වැනි පරිච්ඡේදය**

සැපයුම් වැඩ හා සේවා

සැපයීම් මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය කොන්ත්‍රාත් ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරවීම් (මු.රෙ. 708 සිට 775 දක්වා)

* සටහන.- සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% ක් හෝ ඊට වැඩියෙන් හෝ අපේක්ෂකයකු විසින් ලකුණු ලබාගත යුතුය.

ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.

09-1152

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2013/2014 අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනය සංශෝධනය කිරීම

(අ) ගැසට් නිවේදනයේ 07(iv)
රජයේ පාසල්වල සේවයේ නියුක්ත ගුරුවරුන් 2013/07/05 වැනි දින වන විට ගුරුවරයෙකු ලෙස අවම වශයෙන් වසර තුනක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය.
කෙසේ වුවද මෙම ගුරු අධ්‍යාපන පාඨමාලාවට ගුරුවරුන් නිදහස් කිරීමේ සම්පූර්ණ වගකීම අදාළ පළාත් අධ්‍යාපන ලේකම් සතු වේ.

(ආ) ගැසට් නිවේදනයේ 09 (ii) (ඇ)

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2013/10/15 දක්වා දීර්ඝ කරන ලදී.

අනුර දිසානායක,
අධ්‍යාපන ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 13 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

09-1196

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.